
# ර/ඇඹි/චන්ද්‍රිකාවැව ජයන්ති මහා විද්‍යාලය
# 6 ශ්‍රේණිය
# ICT
# 1.පරිගණකයේ වැදගත්කම

- ❖ දෙවනි වාරයට නියමිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) විෂයෙහි සටහන් මෙහි අන්තර්ගත වේ.
- ❖ සියලුම දරුවන් මෙම සටහන් තම අභ්‍යාස පොතෙහි සටහන් කර තබා ගන්න.
- ❖ පාසල තුල ඔබට සටහන දී අවසන් කළ තැන සිට ආරම්භ කර සටහන ලියන්න පටන් ගන්න.
- ❖ අදාල පාඩමෙහි විෂය කරුණු සාකච්චා කිරීම Online ක්‍රමය හරහා සිදු කර බැවින් සටහන නිවැරදිව සටහන් පොතෙහි සටහන් කර තබා ගන්න

**පරිගණකයක් යනු**

පරිගණකයක් යනු විදුලියෙන් ක්‍රියාත්මක වන ඉලෙක්ට්‍රොනික උපකරණයකි.




පරිගණකයක ප්‍රධාන කාර්ය

ආදානය (Input) → සැකසීම (Process) → ප්‍රතිදානය(Output)

**නිහිත පරිගණක සහිත උපාංග**

**පරිගණක වැඩසටහන් ආශ්‍රයෙන් ක්‍රියාත්මක වන උපකරණ නිහිත පරිගණක උපකරණ ලෙස හඳුන්වයි**

නිහිත පරිගණක සහිත උපාංග

- ජංගම දුරකථන
- රෙදි සෝදන යන්ත්‍ර
- නූතන මෝටර් රථ
- නූතන රූපවාහිනී
- මුද්‍රණ යන්ත්‍ර
- සංඛ්‍යාංක කැමරා

**පරිගණකයක ප්‍රධාන සංරචක**

1) **ආදාන උපක්‍රම -Input Device**
2) **ප්‍රතිදාන උපක්‍රම -Output Device**
3) **මධ්‍ය සැකසුම් ඒකකය- Central Processing Unit**
4) **ප්‍රධාන මතකය - Main Memory**
5) **ආචයන උපක්‍රම - Storage Device**
6) **සන්නිවේදන උපක්‍රම - Communication Devices**

## ආදාන උපක්‍රම (Input devices)

පරිගණකයට දත්ත හා උපදෙස් ලබා දීම සඳහා භාවිත කරන උපාංග ආදාන උපක්‍රම ලෙස හඳුන්වයි.

උදාහරණ

- මූසිකය
- යතුරුපුවරුව
- ස්කෑනරය
- මයික්‍රොෆෝනය
- තීරු කේත කියවනය
- වෙබ් කැමරාව

## ප්‍රතිදාන උපක්‍රම (Output devices)


**පරිගණකය තුළ සකස් කළ දත්ත, තොරතුරු පිටතට ලබා ගැනීම සඳහා භාවිත කරන උපක්‍රම ප්‍රතිදාන උපක්‍රම ලෙස හඳුන්වයි.**

උදාහරණ

- පරිගණක තිරය/සංදර්ශකය
- මුද්‍රණ යන්ත්‍රය
- ශබ්ද විකාශක
- බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය

## මධ්‍ය සැකසුම් ඒකකය (Central Processing Unit)

- ❖ **මධ්‍ය සැකසුම් ඒකකය යනු ලබා දෙන උපදෙස් අනුව ක්‍රියාත්මක වෙමින් දත්ත සැකසීම සිදු කරන අංකිත පරිපථයකි.**
- ❖ **මෙය පරිගණකයේ මොළය ලෙස හඳුන්වයි.**
- ❖ **මධ්‍ය සැකසුම් ඒකකය බාහිරින් නිරීක්ෂණය කළ නොහැකිය.**





මධ්‍ය සැකසුම් ඒකකය පද්ධති ඒකකය තුළ ඇති මව් පුවරුව මත ස්ථානගත කර ඇත.

## ප්‍රධාන මතකය (Main memory)

පරිගණකය ක්‍රියාත්මකව පවතින විට දත්ත, තොරතුරු හා උපදෙස් තාවකාලිකව රඳවා තබා ගන්නා උපාංගය පරිගණකයේ ප්‍රධාන මතකය හෙවත් ප්‍රාථමික මතකය ලෙස හඳුන්වයි.මෙය සසම්භාවී ප්‍රවේශ මතකය ලෙස ද හැඳින්වේ.

## ආවයන උපක්‍රම (Storage devices)

නැවත ප්‍රයෝජනයට ගැනීම සඳහා දත්ත, තොරතුරු හා උපදෙස් ගබඩා කර ගැනීමට භාවිත කරන උපක්‍රම ආවයන උපක්‍රම ලෙස හඳුන්වයි.




## සන්නිවේදන උපක්‍රම (Communication devices)

පරිගණකය තුළ ඇති දත්ත, තොරතුරු වැනි දෑ හුවමාරුව සඳහා භාවිත කරන උපක්‍රම සන්නිවේදන උපක්‍රම ලෙස හඳුන්වයි.

උදාහරණ

- ජාල අතුරුමුහුණත් කාඩ්පත
- මොඩමය
- රවුටරය

## පරිගණක මෘදුකාංග (Software)

පරිගණකය භාවිත කරමින් යම් කාර්යයක් ඉටුකර ගැනීම සඳහා සකස් කර ඇති පරිගණක වැඩසටහන්

**මෘදුකාංග සඳහා උදාහරණ**

- ලිපි ලේඛන සැකසීම සඳහා වදන් සැකසුම් මෘදුකාංග
- පරිගණක ක්‍රීඩා මෘදුකාංග
- වීඩියෝ සංස්කරණ මෘදුකාංග
- චිත්‍ර ඇඳීමට චිත්‍රක මෘදුකාංග
- සිංදු ඇසීමට හා වීඩියෝ බැලීමට මාධ්‍ය ධාවක මෘදුකාංග

## <u>පරිගණක දෘඩාංග ( Hardware)</u>

පරිගණකයක අතින් ඇල්ලිය හැකි මෙන් ම, දැකිය හැකි කොටස් පරිගණක දෘඩාංග ලෙස හඳුන්වයි.

### <u>පරිගණක පද්ධති විවිධ ක්ෂේත්‍ර තුළ යොදා ගෙන ඇති ආකාරය</u>

1) පාසල
2) බැංකු
3) ගොවිපොළ
4) රෝහල්
5) කර්මාන්තශාල

**පාසල**

- පාසක් පද්ධතියේ කාර්යාලීය කටයුතු සිදුකර ගැනීමට
- පාඩම් ඉගැන්වීමට කළු ලෑල්ල සහ පොත වෙනුවට පරිගණකය භාවිතය
- අන්තර්ජාලය භාවිත කරමින් පාසල් විෂයයන්ට අදාළ අමතර කරුණු ලබා ගැනීම

**බැංකු**

- යන්ත්‍රය භාවිතය
- ඉලෙක්ට්‍රොනික කාඩ්පත් භාවිතයෙන් බිල්පත් ගෙවීම
- අන්තර්ජාල බැංකුකරණය

ගොවිපොළ

- අස්වනු නෙළීම සඳහා
- වල් පැළ ඉවත් කිරීම සඳහා
- ජල සැපයුම සඳහා
- පොහොර යෙදීම සඳහා

රෝහල්

- අංකිත උණ කටුව භාවිතය
- පරිගණක භාවිත කරන දැඩි සත්කාර ඒකක භාවිතය
- පරිගණක භාවිත කරන ශාලායාගාර

කර්මාන්තශාල

- ස්වයංක්‍රීය නිෂ්පාදන් පද්ධති
- රොබෝ යන්ත්‍ර භාවිතය